# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 සැප්තැම්බර්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) -0.2%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 අගෝස්තු මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 1.1%ක් ලෙස වාර්තා විය. 2024 සැප්තැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 0.2% ක හා ආහාර නොවන කාණ්ඩයේ -0.4%ක දායකත්වයක් පිළිවෙළින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2024 අගෝස්තු මාසයේදී 2.3% සිට 2024 සැප්තැම්බර් මාසයේ 0.5% දක්වා අඩු වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2024 අගෝස්තු මාසයේදී 0.2% සිට 2024 සැප්තැම්බර් මාසයේදී -0.7% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම:2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2024 අගෝස්තු මාසයේ 204.1 ක් වූ දර්ශකාංකය, 2024 සැප්තැම්බර් මාසයේ දී 203.1 ක් දක්වා අඩු වී ඇති බව වාර්තා විය. මෙමගින් 2024 අගෝස්තු මාසයට සාපේක්ෂව 2024 සැප්තැම්බර් මාසයේ දර්ශකාංකය 1.0ක අඩුවීමක් එනම් 0.48ක ප්‍රතිශතාංක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.35% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.13% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැලකූ විට මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, දෙහි, අර්තාපල්, කුකුළු මස්, බිත්තර, ඉඟුරු, අමු මිරිස්, සීනි, මයිසූර් පරිප්පු, මිරිස් කුඩු, වියළි මිරිස්, ළදරු කිරිපිටි සහ තිරිඟුපිටි යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත්, අලුත් පලතුරු, පොල්, සහල්, ලොකු ළූණු , කහ කුඩු, තේ කුඩු/කොළ යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 සැප්තැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා ‘ප්‍රවාහන’(*පෙට්‍රල්*), ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’(*ජල බිල*) සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, ‘මද්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය’ සහ ‘අධ්‍යාපන’(*ජාත්‍යන්තර පාසල් ගාස්තු*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද, ‘රෙදිපිළි සහ පාවහන්’ සහ ‘විනෝදාත්මක සහ සංස්කෘතික’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එහෙත්, ‘ආපනශාලා සහ හෝටල්’ සහ ‘විවිධ භාණ්ඩ සහ සේවා’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. තවදුරටත් සලකා බැලීමේදී, ‘සෞඛ්‍ය’ සහ ‘සන්නිවේදන’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල සැප්තැම්බර් මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පදනම: 2021=100) ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 අගෝස්තු මාසයේ 2.3% සිට 2024 සැප්තැම්බර් මාසයේදී 1.9% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2023** | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| **2024** | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |
| | ජූලි | 206.9 | 234.0 | 189.4 | 193.7 | -0.6 | 0.0 | 2.5 | 2.9 | 2.2 | 3.0 |
| | අගෝ. | 204.1 | 229.7 | 187.6 | 193.0 | -1.4 | -0.4 | 1.1 | 2.3 | 0.2 | 2.3 |
| | සැප්. | 203.1 | 227.9 | 187.1 | 192.5 | -0.5 | -0.3 | -0.2 | 0.5 | -0.7 | 1.9 |